කලාප අංක 215

අමා ගඟුල

ශ්‍රී. බු. ව. 2569 ක්වූ බිනර මස කලාපය, රා. ව. 2025 ක් වූ සැප්තැම්බර් මස 07 වන දි

වැලිගම, ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාප

ථී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නැණවත්ව නිවනට පත් වී නැවත නැවත දුකට පත් නොවෙමු .

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

පුනප්පුනං ජායති මීයති ච පුනප්පුනං සීවථිකං හරන්ති,
මගඟඤ්ච ලද්ධා අපුනබ්භවාය න පුනප්පුනං ජායති භූරිපඤ්ඤාති.

නැවත නැවත උපදියි, මියයයි, නැවත නැවත සොහොනට ගෙණ යති. නැණවතා නිවන ලබා නැවත නැවත නූපදී.

(සංයුත්ත නිකාය - උදය සූත්‍රය)

ධර්මකාමී පින්වතුනි,

අද බිනර පුර පොහෝ දිනයයි. බුදුරජාණන් වහන්සේ විශාලා නුවර කූටාගාර ශාලා නම් වෙහෙරෙහි වැඩ සිටියදී මහා ප්‍රජාපතී ගෝතමීන් වහන්සේට උතුම් පැවිද්ද ලබා දීම. සරත් ඍතුවේ ආරම්භය, සිරිලක්බිමෙහි පළමුවෙන්ම බුදු සිරිපා පහස ලැබූ මහියංගන මහ වෙහෙරෙහි වාර්ෂික පෙරහර පැවැත්වීම වැනි විශේෂ සිද්ධීන් සිහිපත් කරන සිදුවන උතුම් දිනයෙහි මෙම දහම් පණිවුඩය සඳහා මාතෘකා තබන ලද්දේ සූත්‍ර පිටකයෙහි සංයුත්ත නිකාය බ්‍රාහ්මණ සංයුත්තයට අයත් උදය සූත්‍රයයි.

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන දිනෙක උදෑසනින් පිබිදී ලොව බලා වදාරා, හැඳ පෙරව පාත්‍රයද අරගෙන උදය නැමති බමුණාට අනුග්‍රහ පිණිස එම නිවසට පිඬු පිණිස වැඩම කළහ. බමුණා බුදුහිමියන් දැක සතුටු වී පාත්‍රය පුරා පිණ්ඩපාතය බෙදුව. දෙවෙනි දිනත් ඒ ලෙසටම බුදුහිමි ඒ නිවසටම වැඩිය. බමුණාද පාත්‍රය බතින් පුරවා බෙදුව.තුන්වෙනි දිනයේද පෙර පරිදිම බමුණා ගේ නිවසට වැඩම කළහ. එදිනද බමුණා විසින් පාත්‍රය බතින් පිරවූ නමුත්, "රසයෙහි ගිජු වූ මේ ශ්‍රමණ භවත් ගෞතමයාණන් නැවත නැවත එන්න ගත්තා"යයි පවසා ඇත. භාග්‍යවතුන් වහන්සේ ද එසේ නොක්කාඩු කී බමුණාට ඔහු කියන ලද වචනයක්ම යොදා ගනිමින් බමුණාට ධර්මාවබෝධයට මග වදාරා ඇත. එය සෝලස (16) පුනප්පුන ධර්ම යනුවෙන් සංයුත්ත නිකාය උදය සූත්‍ර අටුවාවෙහි සඳහන් වේ. බුදුපියාණන් වහන්සේ මෙතැනදී ලෝකයේ සිදුවෙන කවුරුත් දන්නා නැවත නැවත සිදුවන කාරණා 16 ක් භාවිතා කරමින් ගාථා 04 ක් වදාරා ඇත. එම පළමු ගාථාව තේරුම් ගනිමු.

පුනප්පුනං වෙව වපන්ති බීජං -පුනප්පුනං වස්සති දෙවරාජා,
පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා - පුනප්පුනං ධඤ්ඤමුපෙති රට්ඨං.

මේ ගාථාවේ සඳහන් වන නැවත නැවත සිදුවන ධර්මතා 04 යනු ගොවියන් නැවත නැවත බීජ වපුරනව. වැස්ස නැවත නැවත වහිනව.ගොවියන් නැවත නැවත කුඹුරු (කෙත්) හානවා. ධාන්‍ය රටට නැවත නැවත ලැබෙනව. එනම් නැවත නැවත රටට ආහාර ලැබෙනව. මීලඟට 02 වෙනි ගාථාව විමසා බලමු.

පුනප්පුනං යාචකා යාචයන්ති- පුනප්පුනං දානපතී දදන්ති,
පුනප්පුනං දානපති දදිත්වා - පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං.

යාචකයන් යලි යලිත් ඉල්ලති. දානපතියන් නැවත නැවත දන්දෙති. නැවත නැවත දන්දීම නිසා ඔවුන් නැවත නැවත සුගතියට පැමිණෙති. මෙම යාචකයන්ගේ ස්වභාවය නැවත නැවත ඉල්ලීමයි. දානපතියන් නැවත නැවත දෙනව. මෙහි දානපති යන වචනය තේරුම් ගත යුතුය. දන්දෙන අය කොටස් 03 කින් බුදු දහමෙ හැඳින් වෙනව. එනම් දාන දාස,දාන සහායක, දානපති වශයෙනි. දානදාස යනු අනුන්ලවා නොඳී බැරිකමට පරමාර්ථයෙන් ඉවත් වී දන් දීමය. දාන සහායක යනු තමන්ට දීමට තරම් ශක්තියක් නැතිවුවද තවත් කෙනෙක් කරන දානාදී පිංකම් වලට ආර්ථික, කායික, මානසික, වශයෙන් සහයෝගය හැකි හැකි පමණින් දීමය. දානපති යනු ශ්‍රද්ධා පෙරදැරිව කර්මය, කර්ම ඵලය පිළිබඳව සිතා ඉතා සැළකිල්ලෙන් දීමය. එවැන්නන්ගේ ඒ දීම නිසා නැවත නැවත යාචකයන් වුවද එනව එසේ දීමෙන් දාන පතියන් නැවත නැවත සුගතියෙ උපදිනව.

මෙහිදී තවද දැනගත යුතු කාරණයක් වන්නේ බුදු දහමට අනුව දානයද? පරිත්‍යාගද? ප්‍රබල වන්නේ යන්නයි. දානය යනු සිවිපසය අත්හැරීමය. පරිත්‍යාගය යනු සිවිපසයද සමග ලෝකය අත්හැරීමය. ආර්‍ය්‍ය සත්‍ය දේශනාවේදී දුක්ඛ නිරෝධය වදාරද්දී **"චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ"** යනුවෙන් වදාළේ එබැවිනි. අපි සංසාර ගමන දිගින් දිගට යන්නෙ ලෝකයට අයිති වස්තූන් ඇස, කණ, නාසය, දිව, ශරීරය, යන ඉන්ද්‍රියයන් මඟින් අල්ලාගෙනයි එනම් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, යන පංච කාම සම්පත්තියට තියන බැඳීමය. එය යමෙක් අත්හරින්නේ නම් ලෝකය = (පංචස්කන්ධය) අත්හැරීමය. මේ ගාථාවෙහි දානපතියන් නැවත නැවත ස්වර්ගස්ථ (සුගතිගාමී) වනවායයි වදාළේ නැවත නැවත දන්දීමේ රහසයි. පරිත්‍යාගයේ ප්‍රාථමික අවස්ථාව දන්දීමය. මේ ගාථාවන් මඟින් උදය බමුණාට පැහැදිලි කරන්නේ දන් දීමෙන් අතහැරීමත් එයින් ලෝභය නැතිවීමත්, ලෝභය තුනී වෙන තරමට සංස්බාර අඩුවීමත්, සංස්බාර අඩුවෙන තරමට එයින් ප්‍රතිසන්ධි විඤ්ඤාණය සැකසීම අඩු වී නැවත නැවත භවයකට යෑම අඩුවීම පෙන්වා දීමය එසේ නැතිව දන්දීම ප්‍රතික්ෂේප කිරීමක් නොවේ. නිවන නැමති පරම අරමුණෙහි පිහිටා දන් දීමය. දැන් අපි තෙවෙනි ගාථාව විමසා බලමු.

පුනප්පුනං ජිරනිකා දුහනති - පුනප්පුනං වවෙජා උපෙති මාතරං,
පුනප්පුනං කිලමති එන්දති ච - පුනප්පුනං ගබ්භමුපෙති මන්දා.

කිරිදොවන්නෝ නැවත නැවත දොවති. වහුපැටියා මව වෙත නැවත නැවත පැමිණේ. (ලෝක සත්වයා) නැවත නැවත වෙහෙසට (ක්ලාන්ත) සහ කම්පා වෙයි.බාලයා (මන්දබුද්ධිකයා) නැවත නැවත සසර උපදී.

මෙම ගාථාවේද නැවත නැවත සිදුවන ධර්මතා 04 කි. කිරි දොවන්නා උදේ

සවස වශයෙන් දිනපතා දොවයි. වහු පැටියාද නැවත නැවත මවු දෙන ලඟට විත් කිරි උරයි. සෑහීමකට පත් නොවේ. මීලඟට වදාරා ඇත්තේ සත්වයා, නැවත නැවත ක්ලාන්ත වීමය. එයින් අදහස් කරන්නේ උපන් සත්වයා අවිද්‍යාව හෙවත් ලෝකය ගැන අනවබෝධයෙන් කෙලෙස් වලින් වෙහෙසට හෙවත් ක්ලාන්ත වීමය. එය නැවත නැවත සිදුවේ. එනම් නැවත නැවත ගැබට පැමිණීම හෙවත් ඉපදීමය. කවුද? එසේ නැවත උපදිනුයේ **"පුනපපුනං ගබ්භමුපෙති මන්දෝ"** මේ බුදු පියාණන් වහන්සේ සසර නැවත නැවත ඉපදෙමින් ක්ලාන්ත වෙමින් යන්නාවූ අපට අවධාරණාර්ථයෙන් දෙන ලද පොදු නාමයයි **"බාලයා"** හෙවත් **"මන්දබුද්ධිකයාය"**. මෙම තත්වයෙන් කොයි තරාතිරමක කෙනෙකු වූවද නිදහස් වන්නේ නිවන් දැක්ක දිනයටයි.

පුනපපුනං ජායති මීයති ච - පුනපපුනං සීවථිකං හරන්ති,
මගඤ්ච ලද්ධා අපුනබ්භවාය - න පුනපපුනං ජායති භූරිපඤ්ඤාති

මෙම ගාථාව සූත්‍රයේ අඩංගු 04 වෙනි ගාථාවයි. එහිද නැවත නැවත වශයෙන් ධර්මතා 04 කි. නැවත නැවත උපදියි, මියයයි, නැවත නැවත සොහොනකට ගෙන යති, නැණවතා නිවනට පත්ව නැවත නැවත නූපදී. බාලයා නැවත නැවත උපදින නිසා තව දුරටත් භව ගමනට කරුණු රැස් වී නැවතත් උපදිනව. එම වාරයක් පාසා මැරෙනවා. ඒ මරණය දුකකි. එසේ දුකට පත්වනුයේ ඉපදුන නිසාය. එවැනි උපතකට හේතු සාදාගනුයේ මන්දබුද්ධික නිසාය. ඒ අනුව සම්මුති ලෝකයේ මොන ප්‍රධානකම්, උගත්කම් තිබුනත් බුදු නුවනට අනුව තවම නිවනට පත් නොවූ බැවින් අපි සැවොම මන්ද බුද්ධිකයෝය. නැවත නැවත පිඬු සිඟා වැඩ උදය බමුණාට **"පුනප්පුන"** වචනය භාවිතා කොට විස්තර කර දුන්නෙ ඉහත කී මන්ද බුද්ධික තත්වයෙන් මිදෙන මාර්ගයයි.

මෙම දේශනාවට අනුව අප සැවොම අනන්ත වූ කාලයක් ඉපදී මියගොස් නැවත නැවත මළකඳ සොහොනට ගෙනගොස් ඇත. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියදී උපසාල්හක නැමති කුලයෙන්, ධනයෙන්, මානයෙන් යුතු එක්තරා බමුණෙකු හිටිය. ඔහුට පුතෙකු හිටිය. ඔහු බුද්ධිමතෙකි. බමුණා පුතාට කියනව "මම මළ විට කවුරුත් දවන සොහොනෙ දවන්න එපා නොයිඳුල් ස්ථානයක දවන්න" එවිට පුතා අහනව "පියාණෙනි! ඒ ස්ථානය මම නොදනිමි, මට එය පෙන්වන්න" කියා. බමුණා පුතු සමග ගොස් ගිජුකුළු පව්වෙහි ගල්කුළු තුනක් අතර බිම පෙන්වීය. දෙදෙනා ආපසු එමින් සිටියදී බුදු හිමියන් කඳු පාමුල වැඩ සිට, කොහි ගියේදැ"යි විමසූ විට පුතා විසින් විස්තරය බුදු හිමියන්ට පැවසීය. බුදු හිමියන් එතැනට යමුයි වදාරා පිය පුතු සමග එතැනට ගොස් සිනා පහළ කොට පුතා අමතා " මානවකය! ඔබේ මේ පියා මෙතැනම දවන්නැයි කීවේ දැන් පමණක් නොවේ මින් ඉහත ආත්මභාව දාහතර දහසක් **උපසාල්හක** නමින්ම මෙතැන අදාහනය කර ඇතැයි" වදාළහ. වෙනත් නම් වලින්ම කොතරම් එතැනම ඔහු ආදාහනය කරන්නට ඇත්දැයි මෙම උපසාල්හක ජාතක දේශනාව අනුව අප විසින් තේරුම් ගත යුතුය. මේ තත්වය නුවණින් දකින යමෙක් වේ නම් ඔහු පුනර්භවය නැති කිරීමට හේතු වෙන මග හෙවත් අරි අටඟිමග අනුගමනය කරනව. පුනර්භවය ඇති කරන්නෙ තණ්හාවෙනි ප්‍රථම දේශනාවෙන්ම **"යායං තණ්හා පොනොභවිකා"** යනුවෙන් වදාළේ එයයි. භාග්‍යවතුන් වහන්සේ උතුම් බුදු පදවියට පත්වී බෝමැඩදීම උදන් අනන ලද්දේ ආත්ම භාවය නැමති ගේ හදන වඩුවා ලෙසට තණ්හාවද, එම ගෙයෙහි මූල පරාලය වූ අවිද්‍යාව ද විනාශ කළ බවයි. අවිද්‍යාව යනු නොදන්නා කමයි. කුමක් නොදන්නා කමද? චතුරාර්ය සත්‍ය පිළිබඳ කිසිදු ආකාරයක අවබෝධය නැති කමය. එම අවිද්‍යාව මූල පරාලයට උපමා කරන

ලද්දේ අනිත් සියළුම පරාල පැවැත්මට පිහිට වී පවතින නිසාය. මූල පරාලය විනාශ වීමෙන් සියල්ලම විනාශ වන්නා සේ අකුසල් මූලයන් කොපමණද? ඒ සියල්ලම අවිද්‍යාව තුළට පැමිණ අවිද්‍යාවම පිහිට කොට පවතින නිසා අවිද්‍යාව මුළුමනින්ම වැනසී යාමෙන් ඒ අකුසල් මුල් සියල්ලම වැනසී යන බව තවදුරටත් සංයුත්ත නිකාය කූට සූත්‍රයෙන්ද වදාරා ඇත. එබැවින් අවිද්‍යාව තේරුම් ගැනීමට අවිද්‍යාව නොනැසී පැවතීමට හේතුව, හේතු ඵල දහමට අනුවම විමසා තේරුම් ගත යුතුය.

උදය බමුණාගේ නිවසට නැවත නැවත පිඬුසිඟා දින තුනක්ම වැඩම කොට නැවත නැවත යන වචනය උපයෝගී කොට නැවත නැවත ඉපදීම දුකක් ලෙසට පෙන්වා වදාළහ. එසේ ඉපදීම දුකක් වුවද සත්වයා, සෑහීමකට පත් නොවීම උන්වහන්සේ උපමා තුළින්ම අවධාරණය කර ඇත. ගොවියාගේ වැපිරීම, ධාන්‍ය නැවත නැවත ලැබීම,යාචකයාගේ ඉල්ලීම, දානපතියන් දන් දී සුගතියට යෑම, කිරි දෙවීම, පැටියා මවු දෙන වෙත යෑම. උපන් සත්වයා කෙලෙස් නිසා වෙහෙසවීම. නැවත නැවත මිය යාම, නැවත නැවත සොහොනට ගෙනයෑම ආදී කාරණා වලින් පෙන්වන්නේ සෑහීමකට පත්නොවීමය. ඒ අනුව නැවත නැවත ඉපදීම යනු සමස්ථ ලෝක සත්ව සංහතියේම ශෝචනීය සිදුවීමය. බුදුරජාණන් වහන්සේලා ලොව පහළ වන්නේ එම ගැටළුවට පිළිතුරු සපයා ලෝ සතුන් දුකින් නිදහස් කිරීමේ මග පෙන්වා දීමටය.

යමෙක් යමක් අන්ධානුකරණයෙන් පිළිගෙන එයට යටත් වී සිටීම භාග්‍යවතුන් වහන්සේ අනුමත නොකළ දෙයකි. සත්‍ය වූ ධර්මයක් විනයක් වදාළේ එබැවිනි. **"ස්වාකඛාතො භගවතා ධම්මො"** යයි අප ගෞරව දක්වන්නේ ඒ ශ්‍රී සද්ධර්මයටයි. **"සවාකඛාත"** යන වචනයේ තේරුම "ඉතා යහපත්ව මනා කොට දේශනා කරන ලද" යන්නය. එසේ වූ ධර්මයකට ලොව ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වදාළ ඒ ධර්මය පමණි. ඒ නිසයි **"සවාකඛාත"** නමින් ධර්මය හඳුන්වනුයේ. එම ධර්මයේ ආරම්භය යහපත් **(ආදී කල්‍යාණං)** මැද යහපත් **(මජ්ඣෙ කල්‍යාණං)** අවසානයත් ඉතා යහපත්ය. **(පරියොසාන කල්‍යාණං)** අර්ථයෙන් යුක්තය **(සාත්ථං)** පිරිසිදු වූ ප්‍රකාශන ශක්තියක් ඇත **(සබ්‍යඤ්ජනං)** පිරිසිදු පිරිපුන් අර්හත්වය නම් බ්‍රහ්මචරිය උගන්වයි. **(කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහමචරියං අභිවදති)** එබැවින් ධර්මය ධර්මය වශයෙන් තෝරා බේරා ගැනීමට තරම් අප භාග්‍යවන්ත විය යුතුය. උදය බමුණා ඒ හැකියාව වහා පිහිටුවා ගැනීමට භාග්‍යවන්ත වුනා. අවසානෙදී බමුණා සහ බිරිඳ, දු පුතුන්, හිත මිතුරු ඥාති යන සමූහයාම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී අද පටන් තෙරුවන් සරණ ගත **"උපාසක"** නම් වූ ශාසනික(ගෞරව) නාමයෙන් පිළිගෙන වදාරණ ලෙස ඉල්ලා සිටි බව සූත්‍රයෙහි දැක්වේ. එසේ උදය බමුණුතුමා ඇතුළු පිරිස සෝවාන් වීමේ මූළික සුදුසු කමක් වන ශ්‍රද්ධාවන්ත වූ ආකාරයට අපද නැවත නැවත දුකට පත්වන සසර ගමන කෙළවර කිරීමට මෙම උදය සූත්‍ර දේශනාව උපකාර වේවායි අධිෂ්ඨාන කර ගනිමු.